# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1980/5 - 2016 අගෝස්තු මස 15 වැනි සඳුදා - 2016.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24(2)(1)(xiii) හා 24(3) සහ මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය යටතේ පනවනු ලබන නියෝගය

1992 අංක 04 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 24(2)(1)(xiii) වගන්තිය හා මධ්‍යම පළාතේ වර්ෂ 2000 අංක 01 දරන මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තියේ 19(ණ) හා (ට) වගන්ති සමග කියවිය යුතු 20 වැනි වගන්තියෙන් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මා වෙත පැවරී ඇති බලතල අනුව පහත නියෝග පනවනු ලබන අතර, 2016.08.22 දින සිට බල පැවැත්විය යුතු බව ද මෙයින් නියෝග කරමි.

නියෝග

මධ්‍යම පළාත තුළ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ බලපත්‍ර ලාභී බස් රථයක ගමන් කරන මගියෙකු තමාගේ ගමනාන්තයට අදළ වන නියමිත මුදල සහ ගමන් ආරම්භය හා අවසානය නිවැරදිව සඳහන් කරන ලද ප්‍රවාහන සේවා අධිකාරිය මගින් අනුමත කර ඇති වලංගු ප්‍රවේශ පත්‍රයක් ලබාගත යුතු වන අතර, ගමන් ආරම්භයේ සිට ගමනාන්තය දක්වා තමා සන්තකයේ තබා ගත යුතු ය. එසේ නොමැතිව බස් රථයේ ගමන් කළ හොත් රුපියල් 250.00ක් සහ සම්පූර්ණ ගමන් ගාස්තුව මෙන් දෙගුණයක් වූ මුදලක ස්ථානීය සේවා ගාස්තුවකට යටත් වේ.

එදිරිවීර වීරවර්ධන,
මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන,
විදුලිබල හා බලශක්ති සහ නිවාස හා
ඉදිකිරීම් අමාත්‍ය.

2016 අගෝස්තු මස 10 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාත් සභාවේ
ප්‍රවාහන අමාත්‍ය කාර්යාලයේ දී ය.

09-31


1A - PG 3059 — 09 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*